# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සහ ග්‍රාමීය සංචරණය

අයි.ජී. අයෝධ්‍යා.එන්. පෙරේරා, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා දෙවන වසර
iganp1@stu.kln.ac.lk

**සංක්ෂේපය**

වර්තමානය වනවිට ලෝකයේ ශීඝ්‍රයෙන් ම දියුණු වන අංශය ලෙස පිළිගනු ලබන්නේ සංචාරක කර්මාන්තය යි. 5% - 8% ත් අතර ඉහල වර්ධන අනුපාතයක් හිමි, අනෙකුත් බැර කර්මාන්තවලට සාපේක්ෂව අවම පිරිවැයක් යොදාගෙන ක්‍රියාත්මක කළහැකි කර්මාන්තයක් ලෙස සංචාරක කර්මාන්තය හැඳින් වේ. එබැවින් බොහෝමයක් නූතන ආර්ථිකයන්හි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස සංචාරක කර්මාන්තය යොදාගනු ලබයි. නමුත් සංචාරක කර්මාන්තයට අදාළ සංවර්ධන උපාය මාර්ග එක් එක් රටවලට ආවේණික වේ. එබැවින් තම රටට ආවේණික උපාය මාර්ග තෝරා ගැනීම වැදගත් ය. ශ්‍රී ලංකාව වැනි දේශීය සම්පත්වලින් ආඪ්‍ය වූ නමුත් ආර්ථික වශයෙන් එතරම් ශක්තිමත් නො වූ රටක් තම දේශීයත්වය පදනම් කරගත් සංචාරක ව්‍යාපෘතීන් යොදා ගැනීම වඩාත් යෝග්‍ය වන අතර, ඒ සඳහා ග්‍රාමීය සංචරණ සංකල්පය වැනි සංකල්ප යොදා ගත හැකි ය. එබැවින් සංචාරක කර්මාන්තය සඳහා වැයවන පිරිවැය අවම කරමින් ප්‍රතිලාභ උපරිම කරගැනීම උදෙසා මෙන් ම දේශීය අනන්‍යතාව සහ දේශීය සම්පත් ආරක්ෂා කරගනිමින් සංවර්ධන අරමුණ සාක්ෂාත් කරගැනීමට ග්‍රාමීය සංචරණ සංකල්පය කොතරම් යෝග්‍යවනවා ද යන්න පිළිබඳ විමසා බැලීම මෙම ලිපියෙන් අරමුණු කෙරේ.

**මුඛ්‍ය පද:** ආර්ථික සංවර්ධනය, ග්‍රාමීය සංචරණය

## හැඳින්වීම

අතීතයේ දී ඉතා ධනවත් සමාජ පන්තියකට අයත් පුද්ගලයින් හට පමණක් වෙන් වූ සංචාරණය සමාජයේ ආර්ථික වටිනාකමක් සහිත වූ සාධකයක් නො වීය. එකල අධික මුදලක් ගෙවා සංචාරණයේ යෙදීමට මධ්‍යම පාන්තිකයන්ට හැකියාවක් නො තිබුණි. නමුත් කාර්මික විප්ලවයෙන් පසුව ඇති වූ ප්‍රවාහන දියුණුවත් තාක්ෂණික දියුණුවත් මෙන් ම මධ්‍යම පාන්තික කම්කරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළයාමත් සමඟ සංචාරණයේ ආර්ථික වටිනාකම ඉහළ ගියේ ය. ඒ අනුව දේශීය මෙන් ම විදේශීය සංචාරණය ද ප්‍රචලිත විය. එමඟින් සංචාරණය යන්න කර්මාන්තයක් ලෙස ආර්ථික සංවර්ධන උපාය මාර්ගයක් වශයෙන් යොදා ගැනීම ආරම්භ විය. එසේ ඇරඹුණු සංචාරක කර්මාන්තය පිළිබඳ නිර්වචනය කරන්නන් දක්වන්නේ පැය 24 කට වඩා කාලයක් තම වාසස්ථානයෙන් බැහැරව ආදයම් ඉපයීමේ අරමුණකින් තොරව යම් ප්‍රදේශයක් වෙත ගමන් කිරීම සංචාරණය ලෙස හඳුන්වන බව යි. මෙසේ නිර්වචනය වන සංචාරණය ලොව පුරා ව්‍යාප්ත වනවිට සංචාරණයේ විෂය පථය ද ක්‍රමයෙන් පුළුල් වන්නට විය. එය කාලීන අවශ්‍යතා අනුව විවිධ සංකල්පවලට බෙදා දක්වනු ලැබුණි. එනම් රුදෙස් සංචරණය, පරිසර සංචරණය, ග්‍රාමීය සංචරණය, ප්‍රජා පාදක සංචරණය, තිරසර සංචරණය ආදි ලෙසිනි.

ඒ අතරින් ග්‍රාමීය සංචරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ග්‍රාමීය සංචරණය යනු ග්‍රාමීය ප්‍රදේශවල පවතින සම්පත් සහ දේශීය ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය යොදාගෙන

ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව සංචාරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම යි. ඒ තුළ දේශීය ප්‍රජාවගේ දෛනික ක්‍රියාකාරකම් සංචාරක ව්‍යාපෘති සඳහා යොදා ගනියි. එහි දී මූලිකව ම බලාපොරොත්තු වන්නේ සංචාරණ කර්මාන්තයේ ප්‍රතිලාභ සෘජුව ම දේශීය ජනයා වෙත ලබාදීම යි. මෙම සංකල්පය ඉතා දුර අතීතයක සිට ක්‍රියාත්මක වන සංචාරණ ක්‍රමවේදයක් වන අතර, මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීමෙන් රටක් තුළ පවතින දිළිඳුකම අවම කිරීම, යටිතල පහසුකම් දියුණු කිරීම මෙන් ම ප්‍රධාන වශයෙන් ආදායම් විසමතාව අවම කිරීම අරමුණු කරගනී.

රටක සංවර්ධනය යනු එම රට ආර්ථික, සමාජීය සහ පාරිසරික යන අංශ 03 න් ම වර්ධනය කිරීම යි. එය ඇතැම් ආර්ථික විද්‍යාඥයින් විසින් ‘ස්වයංපෝෂිත වර්ධනය’ නැතහොත් ‘තිරසාර සංවර්ධනය’ ලෙසින් හඳුන්වා දී ඇත (ආර්ථික විමසුම, 2004). එහි දී ආර්ථික වර්ධනය යනු අත්‍යවශ්‍ය අංගයකි. එක් එක් රටවල් ඒ සඳහා විවිධ ක්‍රමවේදයන් යොදාගනු ලබන අතර, සංචාරක කර්මාන්තයට ඒ අතරින් සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එබැවින් එහි ඇති වාසි සහගත බව නිසා ම බොහොමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල් සංචාරක කර්මාන්තය සංවර්ධන උපාය මාර්ගයක් ලෙස යොදා ගනු ලබයි. කේටර් (Cater) නැමැති පර්යේෂකයාට අනුව සංචාරක කර්මාන්තය සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින රෝගවලට පිළියම් යෙදිය හැකි සර්ව රෝග නාශකයකි (ගුණවර්ධන, 2008). ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද සංචාරක කර්මාන්තය විදේශ විනිමය උපයන කර්මාන්ත අතර තෙවන ස්ථානය හිමිකර ගැනීමෙන් එය සනාථ කරවයි (ආර්ථිකවිද්‍යා, 2004). එබැවින් එය ශ්‍රී ලංකාව වැනි රටවලට ද අවම පිරිවැයකින් ක්‍රියාත්මක කරමින් විශාල ප්‍රතිලාභ ලබාගත හැකි කර්මාන්තයක් ලෙස නම් කළ හැකි ය. එසේම ශ්‍රී ලංකාව ඉහත සඳහන් කළ පරිදි දේශීය සම්පත්වලින් පිරිපුන් රටක් නිසාත් ලංකාව තුළ බහුලව පවතින්නේ ග්‍රාමීය ප්‍රදේශ කේන්ද්‍ර කරගත් ආර්ථික ක්‍රමයන් නිසාත් සංචාරක කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය සංචරණය යොදා ගැනීමේ වැදගත්කම අංශ කිහිපයකින් සලකා බැලීමට හැකියාව ඇත.

### ආර්ථික වශයෙන්

රටක ආර්ථිකය වර්ධනය වීම යනු එරට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම යි. ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් වීමට නම් ඔවුනට යහපත් ආදායම් මාර්ගයක් තිබිය යුතු වේ. එවැනි රැකියා සම්පාදන ක්‍රමවේදයක් ලෙස මේ වන විට සංචාරක ව්‍යාපාරය මූලිකත්වය ලබාගෙන ඇත. රටක බිහි වන සෑම රැකියාවන් 05 කට ම 01 ක් සංචාරක ව්‍යාපාරය සමඟ බැඳී පවතින බව පිළිගනි යි (ආර්ථිකවිද්‍යා, 2002). එබැවින් ග්‍රාමීය සංචාරණය රටක ක්‍රියාත්මක කිරීම හේතුවෙන් තවදුරටත් මෙම රැකියා සම්පාදනය රටේ ජනතාව වෙත සමීප කළ හැකි ය. ශ්‍රී ලංකාව පිළිබඳ අවධානය යොමු කළ විට රටේ බහුතර ජනයා ජීවත් වන්නේ ග්‍රාමීය පෙදෙස්වල ය. ඒ හේතුවෙන් ග්‍රාමීය සංචාරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා ග්‍රාමීය ජනතාවට රැකියා විශාල සංඛ්‍යාවක් හිමි වේ. නිදසුන් ලෙස ග්‍රාමීය සංචාරණය හේතුවෙන් සංචාරකයන්ට මඟ පෙන්වන්නන් ලෙස කටයුතු කරන්නන්, නවාතැන් පහසුකම් සපයන්නන්, ආහාර සපයන්නන් වැනි සෘජු රැකියා සේම ඒ ආශ්‍රිත වක්‍ර රැකියාවන් ද බිහි වේ. එනම් කෘෂිකාර්මික කටයුතු, වෙස් මුහුණු, රේන්ද, මැටි, වේවැල් වැනි දේශීය කර්මාන්ත ආශ්‍රිත රැකියාවන් දැක්විය හැකි ය. මෙම සංකල්පය යටතේ සංචාරකයා සාමාන්‍ය ජනයා සමඟ සෘජුව ම ගනුදෙනු කිරීම

නිසා අතරමැදියනගෙන් තොරව සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනයා වෙත ගලා යයි. එසේ ම ගෘහාශ්‍රිත කර්මාන්තවල දියුණුව නිසා රැකියාවන්හි කාන්තා නියෝජනය ඉහළ යාම ද අපේක්ෂා කළ හැකි ය.

තව ද ග්‍රාමීය සංචාරණය හේතුවෙන් තවමත් නොදියුණු තත්ත්වයේ පවත්නා ග්‍රාමීය ප්‍රදේශවලට දියුණු යටිතල පහසුකම් හිමි වේ. එනම් අබන්ධව ග්‍රාමීය ප්‍රදේශ වෙත සංචාරකයින් පැමිණෙන විට එම ප්‍රදේශයන්ට අදාළව දියුණු මාර්ග පද්ධති, දියුණු ප්‍රවාහන ක්‍රමවේදයන්, විදුලිය, ජලය, වෙළෙඳ මධ්‍යස්ථාන ආදි පහසුකම් ප්‍රදේශවාසීන් වෙත හිමි වේ. උදාහරණ ලෙස හම්බන්තොට අධිවේගී මාර්ගය, කින්නියා පාලම, නවීකරණය වූ දහඅට වංගු මාර්ගය ආදිය දැක්විය හැකි ය. එසේම ග්‍රාමීය සංචාරණය බොහෝ විට දේශීය සහ ස්වාභාවික සම්පත් යොදාගෙන ක්‍රියාත්මක වන බැවින් ශ්‍රමය, ප්‍රාග්ධනය බොහෝදුරට දේශීයව ලබාගැනේ. එසේම ග්‍රාමීය සංචාරණය තුළ සුවිශාල හෝටල් හෝ වෙළෙඳසැල් හෝ නොපවතින නිසා විශාල ආයෝජන හෝ මහා පරිමාණ මූල්‍ය අනුග්‍රහයක් අවශ්‍ය නොවේ. එබැවින් අනෙක් කර්මාන්තවලට සාපේක්ෂව අඩු පිරිවැයකින් ග්‍රාමීය සංචාරණ ව්‍යාපෘති මෙහෙයවිය හැකි ය. එසේම විශාල සංචාරක ආයෝජන බොහෝවිට සංචාරක අවාරයන්හි දී (off-season) අලාභ ලබන තත්ත්වයට පත් වේ. එනම් සංචාරක අවාරයන්හි දී සංචාරකයින් පැමිණීම අඩු වන බැවින් ආදායම අඩු වුව ද හෝටල්, වෙළෙඳ සංකීර්ණ ආදියෙහි නඩත්තු වියදම්, සේවක වැටුප් ආදි පිරිවැය අබන්ඩ ව දැරීමට සිදු වේ. නමුත් ග්‍රාමීය සංචාරණයේ දී ගැමි ජනයාගේ සාමාන්‍ය ජීවන රටාව සංචාරක ව්‍යාපාරයට යොදා ගන්නා හෙයින් එවැනි අලාභ ලැබීමක් සිදු නො වේ. තව ද ගැමි ජනයාගේ සාමාන්‍ය ජීවන රටාව පාදක කර ගැනීම නිසා සුබෝපභෝගී සංචාරක ව්‍යාපාරයට යොදා ගන්නා ආනයනික ද්‍රව්‍ය වෙනුවට දේශීය සම්පත් උපයෝගීතාව හේතුවෙන් ආනයන වියදම් ද අඩුවීමේ ප්‍රවණතාවක් අපේක්ෂා කළ හැකි ය. මේ අනුව ග්‍රාමීය සංචාරණ ව්‍යාපෘති මඟින් රටට ලැබෙන ශුද්ධ ලැබීම් ඉහළ යාම ආර්ථික වශයෙන් යහපත් ගෙවුම් ශේෂයක් පවත්වා ගැනීමට උපකාරී වන අතර, ආර්ථික වශයෙන් එය රටේ අනාගතය පිළිබඳ යහපත් ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

**පාරිසරික සහ සමාජීය වශයෙන්**

ග්‍රාමීය සංචාරණ සංකල්පයේ සුවිශේෂීත්වය වන්නේ සැමවිට ම ග්‍රාමීය සංචරණය ක්‍රියාත්මක කළ යුත්තේ පරිසරයට සහ ග්‍රාමීය ජීවන තත්ත්වයන්ට දරාගත හැකි ආකාරයට වීම යි (ආර්ථික විමසුම, 2011). එමනිසා ශ්‍රී ලංකාව වැනි ග්‍රාමීය ප්‍රදේශ බහුල රටක ක්‍රියාත්මක වන සංචාරක කර්මාන්තය ග්‍රාමීය සංචරණය වැනි සංකල්පයක් යටතේ ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ. එනම් වර්තමානයේ සිදුවන ශීඝ්‍රගාමී කාර්මීකරණයත් සමඟ විවිධ සංවර්ධන උපාය මාර්ග හේතුවෙන් පරිසරයට සිදුවන හානිය ඉතා ඉහළ ය. ක්‍රිස්ටෝපර් හොලෝවේ නම් සංචාරක විශේෂඥයා පවසන්නේ සංචාරක ව්‍යාපාරය විසින් ම සංචාරක ව්‍යාපාරය විනාශ කර ගන්නා බව ය (ආර්ථිකවිද්‍යා, 2002). එනම් සංචාරක කර්මාන්තය නිසා පරිසරයට හානි පැමිණ වීම තුළ සංචාරක කර්මාන්තය ම විනාශ වන බව යි. එමඟින් ගම්‍ය වන්නේ සංචාරක ව්‍යාපාරය ක්‍රියාත්මක වීමට නම් පරිසරය අත්‍යවශය සාධකයක් වන බව ය. බොහෝ සංචාරකයින් සංචාරක ගමනාන්ත තෝරා ගනු ලබන්නේ එහි තිබෙන ස්වාභාවික සහ

දේශගුණික විවිධත්වයන් රසවිඳීම අරමුණු කර ගනිමින් ය. ශ්‍රී ලංකාව ද එවැනි පරිසර සෞන්දර්යයක් හිමි ආකර්ෂණීය ගමනාන්තයකි. උදාහරණ ලෙස සිංහරාජ, යාල, විල්පත්තු වැනි අභය භූමි මෙන් ම පාසිකුඩා, නිලාවේලි, දකුණු දිගවෙරළ තීරයන් ද මධ්‍යම කඳුකරයේ ස්භාවික පරිසරය සහ එයට ම ආවේණික දේශගුණය ද දැක්විය හැකි ය. මෙවැනි ජෛව විවිධත්වයකින් යුතු ශ්‍රී ලංකාව තුළ සංචාරක ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට කෘත්‍රිම නිර්මාණයන් අවශ්‍ය නොවේ. විදේශ රටවල මෙන් කෘත්‍රිම නිර්මාණයන්ගෙන් යුත් විශාල පිරිවැයක් සහිත විදේශ ආයෝජන සහ ව්‍යාපෘති තුළින් බොහෝවිට සිදුවන්නේ පරිසර හානි ය. එමනිසා සංචාරක ව්‍යාපෘතියක් තෝරා ගැනීමේ දී ස්වාභාවික පරිසරයට හානියක් නොවන ක්‍රමවේදයන් තෝරා ගැනීම වැදගත් වේ.

එහි දී ග්‍රාමීය සංචාරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ග්‍රාමීය සංචාරණය හරහා ස්වාභාවික පරිසරය පවතින ලෙසින් ම සංචාරකයන්ට හඳුන්වා දෙයි. එම පරිසරයට ගැළපෙන ක්‍රියාකාරකම් සිදු කරයි. උදාහරණ ලෙස කෘෂිකාර්මික කටයුතුවල දී සංචාරකයින් සහභාගී කරගැනීම, ග්‍රාමීය ප්‍රදේශයන්හි ප්‍රවාහනයට පාපැදි වැනි පරිසර හිතකාමී ක්‍රමයන් යොදා ගැනීම, වායුසමීකරණය කළ හෝටල් වෙනුවට ග්‍රාමීය පෙදෙස්වල ස්වාභාවික වාතාශ්‍රය ලැබෙන නවාතැන් පහසුකම් ලබාදීම ආදිය දැක්විය හැකි ය. එමඟින් පාරසරික වශයෙන් සංචාරක කර්මාන්තයේ ධනාත්මක හැසිරීමක් දක්නට ලැබෙන අතර, එය තවදුරටත් සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිලාභ ලැබීමට ඉවහල් වේ.

රටක් සංවර්ධනය වීම තුළ ජනතාවගේ සමාජීය ජීවිතය වර්ධනය වීම ද අත්‍යවශය සාධකයකි. එබැවින් ග්‍රාමීය සංචාරණය සංවර්ධන සංකල්පයක් ලෙස සමාජීය වශයෙන් සිදු කරන බලපෑම ඉතා වැදගත් වේ. ග්‍රාමීය සංචාරණය නිසා ආර්ථික ප්‍රතිලාභ ලබා ගන්නා ගැමි ජනයාගේ ජීවන තත්ත්වය ඉහළ යාම හේතුවෙන් ඔවුනට සමාජීය වශයෙන් ලැබෙන වටිනාකම ද ඉහළ යයි. සංචාරක කර්මාන්තය හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශයන්ට ව්‍යාප්ත වන නව දැනුම, තාක්ෂණය ප්‍රදේශවාසීන් පිටස්තර ලෝකයත් සමග ගණුදෙනු කිරීමට පොළඹවනු ලබන අතර, එය ග්‍රාමීය දූ දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමට ද උපකාරී වේ. එසේම ගැමි ජනයා නාගරික ප්‍රදේශ වෙත සංක්‍රමණය වීම අවම කිරීමටත් ඔවුන්ට තම ප්‍රදේශයේ සිට ම සංවර්ධනයේ ප්‍රතිඵල භුක්ති විඳීමට සැලැස්වීමටත් ග්‍රාමීය සංචාරණය උපකාරී වේ.

**ග්‍රාමීය සංචරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිලාභ සහ සීමාවන්**

මීළඟට ග්‍රාමීය සංචාරණ සංකල්පය ක්‍රියාත්මක කිරීමේ යෝග්‍යතාව සේම එය ක්‍රියාත්මක කිරීමෙන් හිමි වන ප්‍රතිලාභ පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත් වේ. එහි දී වාර්ෂිකව සංචාරක කර්මාන්තය නිසා මෙරට තුළ බිහිවන රැකියාවන් ප්‍රමාණය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවති යි. 2010 දී සංචාරක කර්මාන්තයට සම්බන්ධ ඍජු හා වක්‍ර රැකියා 123,055 ක් ද, 2011 දී 138, 685 ක් ද, 2013 වන විට එය 270,150 ක් බවට ද වර්ධනය වී ඇත (සංඛ්‍යා දත්ත පත්‍රිකාව, 2014). එසේ රට තුළ සේවා වියුක්තිය අවම කිරීමට විශාල දායකත්වයක් සපයනු ලබන සංවර්ධන ක්‍රියාමාර්ගයක් වන සංචාරක ව්‍යාපාරයේ දී ග්‍රාමීය සංචාරණය වඩාත් වැදගත් වේ. එනම් ග්‍රාමීය සංචරණයට පාදක වන්නේ සාමාන්‍ය ගැමි ජනයාගේ ජීවන රටාව යි. එහි දී සාමාන්‍ය ගැමි ජනතාවට විශේෂ පුහුණුවක් හෝ අධ්‍යාපනයක් නොමැතිව වුව ද ග්‍රාමීය සංචාරණ ව්‍යාපෘතිවලට සහභාගී

වීම අපහසු නොවේ. එමගින් මෙරට තරුණ සේවා වියුක්ති ගැටලුව විසඳීමට අති විශාල සහයෝගයක් ලබාදෙයි. එසේම දේශීය කෘෂිකර්මය, මැටි කර්මාන්තය, රෙදිපිළි කර්මාන්තය ඇතුලු වටිනා දේශීය කර්මාන්ත රැසක් ම මේ හරහා නැවත ආර්ථික වටිනාකමක් සහිත කර්මාන්ත ලෙසින් සමාජගත කිරීමේ හැකියාව ලැබේ. එහි දී ඒවාට ලැබෙන වටිනාකම හේතුවෙන් එම කර්මාන්තවල සේවා නියුක්තිය ඉහළ යාමක් අපේක්ෂා කළ හැකි ය. එසේම සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස සාධනය කරගත යුතු සංවර්ධන අරමුණක් වන්නේ කාන්තාවන්ගේ සේවා නියුක්තිය ඉහළ නංවා ගැනීම යි. එහි දී මෙවැනි ගෘහ කර්මාන්ත නැවත පණගැන්වීම තුළින් එම අරමුණ ඉටුකර ගැනීම පහසු වේ. උදාහරණයක් ලෙස මෙරට පවතින රේන්ද කර්මාන්තයට නිසි ආර්ථික වටිනාකමක් ලැබීම කාන්තා සේවා නියුක්තිය ඉහළ නැංවීමට බෙහෙවින් උපකාරී වේ. එසේම ග්‍රාමීය සංචරණය ක්‍රියාත්මක කිරීමේ දී දේශීය සම්පත් උපයෝජනය කිරීම තුළ මෙතෙක් උපයෝජනය නොවී සේවා වියුක්තිය පවතින නිෂ්පාදන සම්පත් රාශියක ප්‍රතිලාභ ලබා ගැනීමට ද හැකියාව ලැබෙන අතර, ග්‍රාමීය ප්‍රදේශ මූලික කොටගෙන ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘති නිසා රටේ ආදායම් බෙදීයාම් විසමතාව ද අවම වේ. එනම් වෙනත් සුඛෝපභෝගී සංචාරක ව්‍යාපාරවල ආදායම සැමවිට ම කේන්ද්‍රගත වන්නේ මහා පරිමාණ ආයෝජන හා ධනවත් ව්‍යාපාරිකයන් වෙත යි. නමුත් ග්‍රාමීය සංචාරණයේ දී එම ආදායම සාමාන්‍ය ජනතාවට බෙදී යන්නේ මෙහි දී සංචාරකයා ඍජුව ම සාමාන්‍ය ජනතාව සමගින් සම්බන්ධ වන බැවිනි. එසේම ග්‍රාමීය සංචරණය ක්‍රියාත්මක කිරීම නිසා සාමාන්‍ය ගැමි ජනයාට ද ජාත්‍යන්තරය සමග සම්බන්ධ වීමට අවස්ථාව හිමි වන අතර, ඒ තුළින් සිදුවන සමාජානුයෝජනය හේතුවෙන් රට තුළ පවතින සමාජ ගැටලු රාශියකට ද විසඳුම් ලබාදිය හැකි ය. තව ද බොහෝ දුරට ග්‍රාමීය සංචරණය මෙරට සංස්කෘතියක් සමග නොගැටී සමගාමී ව ගමන් කරන බැවින් එය රටේ සංස්කෘතික හර පද්ධතීන්ගේ දියුණුව උදෙසා යොදාගත හැකි වේ. එබැවින් ශ්‍රී ලාංකික අනන්‍යතාව අරක්ෂා කරගත් ශ්‍රී ලංකාවට ම සුවිශේෂී වූ සංචාරක ව්‍යාපෘතියක් මෙහෙයවීමට ග්‍රාමීය සංචරණය යොදාගත හැකි වීම සුවිශේෂී ප්‍රතිලාභයකි.

මෙවැනි සංචාරණ සංකල්පයක් ක්‍රියාත්මක කිරීමේ දී ලබන ප්‍රතිලාභයන්ට අමතරව ජනිත වන සීමාවන් ද රාශියකි. එනම්, ඇතැම් සංචාරකයින් තමන්ගේ හුරු ජීවන රටාවෙන් පිටතට පැමිණීමට අකමැති විය හැකි ය. එබැවින් මෙවැනි අත්දැකීම් ලබා ගැනීමට යොමුවන සංචාරකයින් ප්‍රමාණය අඩු විය හැකි ය. එසේම ඇතැම් විට සංචාරකයින් මෙවැනි අත්දැකීම් විඳ ගැනීමට ග්‍රාමීය පෙදෙස් වෙත සංචරණය කළ ද ග්‍රාමීය ජනතාවත් සමග සම්බන්ධවීමේ දී ප්‍රායෝගික ගැටලු මතුවිය හැකි ය. දෙපාර්ශවයේ ම පවතින භාෂාව පිළිබඳ ගැටලුව මෙන් ම සංචාරකයින්ගේ ආහාරපාන සහ අනෙක් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පුහුණු වූ මඟ පෙන්වන්නන් (Tourist Guide), පුහුණු සූපවේදීන් (chef) වැනි පුද්ගලයින් අවශ්‍ය වේ. එසේම සංචාරකයාගේ සංස්කෘතික පසුබිම අනුව විවිධ වුවමනා ඉටු කිරීමට ද සත්කාරක රටට සිදුවන අතර, එය ද ග්‍රාමීය සංචාරක ව්‍යාපෘතියේ ගැටලු මතුකරවන අවස්ථාවකි. එසේම මූල්‍ය පහසුකම්, සන්නිවේදන පහසුකම් ලබා ගැනීමේ ගැටලු නිසා ද ග්‍රාමීය සංචරණයේ ප්‍රායෝගිකත්වය සීමාවිය හැකි ය. තව ද ග්‍රාමීය සංචරණය තුළ ද පෞද්ගලික මහා පරිමාණ අයෝජනයන්ගේ මැදිහත්වීම මත සිදුවන තැරැව්කරුවන්ගේ ආගමනය ග්‍රාමීය සංචරණයේ සැබෑ අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධා පමුණුව යි. තව දුරටත් විදේශ

සංචාරකයින් ගේ ඇතැම් නොගැළපෙන චර්යාවන් ගැමි ජනයාගේ චර්යා රටාවන් වෙනස් කිරීමට හේතුවන බැවින් එය ශ්‍රී ලාංකික අනන්‍යතාව රැක ගැනීමේ දී අභියෝගයක් වේ. එවැනි චර්යා රටාවන් හරහා විවිධ සමාජ විරෝධී, සංස්කෘතික විරෝධී ක්‍රියාවන් සමාජගත වීම රටේ අනාගත පරපුර වෙත අයහපත් අයුරින් බලපෑම් කළ හැකි ය.

**සමාලෝචනය**

වර්තමානයේ ලොව පුරා සංවර්ධන උපාය මාර්ගයක් ලෙස සංචාරක ව්‍යාපාරයට හිමි වන්නේ පළමු ස්ථානය යි. එහි දී ඉහත දක්වන ලද සාධක මත ශ්‍රී ලංකාව වැනි ග්‍රාමීය සමාජ පද්ධතීන් බහුල රටකට සුවිශේෂී වූ සංචාරණ උපාය මාර්යක් ලෙස ග්‍රාමීය සංචාරණය වඩාත් යෝග්‍ය වන බව පැහැදිලි වේ. එනම් රටේ පවතින ස්වභාවික පරිසරය ආරක්ෂාකර ගනිමින් අවම පිරිවැයක් යොදවමින් ලාංකික ජනතාවගේ ජීවන රටාවට සහ සංස්කෘතියට සමගාමීව ගමන් කරමින් සංචාරක ව්‍යාපෘති මෙහෙයවීමට මෙමඟින් අවස්ථාව හිමි වේ. එසේම සෘණ බාහිරතා අවම සංචාරක කර්මාන්තයක් ලෙස සහ ශ්‍රී ලංකාවට ම අනන්‍ය වූ ලක්ෂණ සපිරි ඒකාධිකාරී ස්වරූපයකින් මෙහෙයවිය හැකි සංචාරක කර්මාන්තයක් ලෙස රටට හිමිකර දෙන ශුද්ධ ලැබීම් ඉහළ මට්ටමක පවත්වාගැනීමට ග්‍රාමීය සංචාරණය උපකාරී වේ. නමුත් ඉහතින් දක්වන ලද විවිධ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් මෙහි ප්‍රායෝගිකත්වය සීමා වන අතර, එවැනි තත්ත්වයන් අවම කිරීමට රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් ද්විත්වය ම සමගාමීව විධිමත් සැලසුම් සහිතව ක්‍රියාත්මකවීම අත්‍යවශ්‍ය වේ. එහි දී ග්‍රාමීය සංචාරණයට ආවේණික වූ ජනතා හිතකාමී අරමුණු සුරැකෙන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වනබව අවධාරණය කළයුතු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ගුණවර්ධන, පී. සහ සල්ඩීන්, එම්. (2008) ''*සංචාරක කර්මාන්තය දියුණු වෙමින් පවතින රටවල් සහ සංචාරක නිෂ්පාදන*'', සමන්ති පොත් ප්‍රකාශකයෝ, හෙට්ටිගම, ජා-ඇල.

අමරසිංහ, එස්.එම්.එන්.පී. (2002) ''*ශ්‍රී ලංකාවේ සංචාරණ ව්‍යාපාරය ප්‍රතිලාභ හා එහි බලපෑම*'', ආර්ථිකවිද්‍යා-අගෝස්තු, ආර්ථිකවිද්‍යා, සමාජ සංඛාන, දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගම් ශාස්ත්‍රීය සංග්‍රහය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

අස්ලාම්, එම්.එස්.එම්. (2011) ''*තිරසාර ග්‍රාමීය සංවර්ධනය සඳහා විකල්ප සංචාරණ ව්‍යාපාරයේ කාර්යය භාර්යය*'', ආර්ථික විමසුම, පෙබරවාරි/මාර්තු.

බණ්ඩාර, එච්.එම්. (2004) ''*පරිසර හිතකර සංචාරණය : විකල්ප සංවර්ධන උපක්‍රමය*'', ආර්ථික විමසුම, ජනවාරි/මාර්තු.

කුලතුංග, එස්.ඩබ්.කේ.එස්. (2004), ''*පරිසරය සුරකින සංචාරක කර්මාන්තයක්*'', ආර්ථිකවිද්‍යා, ආර්ථිකවිද්‍යා, සමාජ සංඛාන, දේශපාලන විද්‍යා ශිෂ්‍ය සංගම් ශාස්ත්‍රීය සංග්‍රහය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

සංඛ්‍යා දත්ත පත්‍රිකාව (ශ්‍රී ලංකාව-2014), ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තුමේන්තුව, කොළඹ.